# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුර සඳහා අයදුම්පත් 2025.11.14 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකාධිකාරී/ ආයතන සහ සාමාන්‍ය පරිපාලන, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් සහ වැඩිදුර තොරතුරු වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි වෙබ් අඩවිය වන **https://pgim.cmb.ac.lk** වෙතින් ලබාගත හැක. නිර්දේශිත ආකෘතියෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් හෝ සුදුසුකම් සහ පළපුරුද්ද සත්‍යාපනය කිරීමේ සහතිකවල සහතිකකරණ ලද පිටපත් ඇතුළු අවශ්‍ය තොරතුරු සපයා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රමාද වී කෙරෙන ඉදිරිපත් කිරීම් පිළිනොගන්නා අතර, ප්‍රතික්ෂේප කරනලද අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

## 01. රියදුරු තනතුරු (ශ්‍රේණිය III) - තනතුරු 04

**සුදුසුකම් :**

උපරිම වාර දෙකකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස (සා/පෙ) විභාගය විෂයන් හයකින් (06) සමත් වී තිබීම.

**සහ**

බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා තිබිය යුතු අතර, බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 3ක් වාහන පැදවීමේ පළපුරුද්ද තිබිය යුතුය.

**වයස** : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වෙනත්** : සියලුම අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ii. තනතුරට අදාළ රාජකාරි මනාව ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**තෝරාගැනීම** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය** : රු. 48,005-16X490-55,845, 2025.01.01 දිනට මාසිකව (U PL 3 (III))

**වැඩබලන අධ්‍යක්ෂ,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**